ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති උපාධි වැඩසටහන 2022/2023
අවසාන පරීක්ෂණය - 2022

**SNPA904** - සමකාලීන අධ්‍යපන පද්ධතිය තුළ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන කළමනාකරණය

කාලය - පැය තුන (03) යි.

---

දිනය : 2024.02.25 වේලාව : ප.ව.01.30 - ප.ව. 4.30 දක්වා

---

ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

01. (i.) ඵලදායි අන්තර්කරණ පාසලක ගතිලක්ෂණ මොනවාද? (ලකුණු 20)

(ii.) (අ.) පාසලේ වැඩිදියුණුව සඳහා දායකවන මූලික සාධක මොනවාද?

(ආ) ඔබේ කලාපයේ විශේෂ අධ්‍යාපන ගුරුවරයාගේ සහයෝගය ඇතිව ඔබේ කාලාපය තුළ ඔබ විසින් ආදර්ශ විශේෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට සූදානම් වන බව සිතන්න. මෙම සම්පත් මධ්‍යස්ථානය සඳහා වන දැක්ම (Vision) නිර්මාණය කොට, දැක්ම මඟින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා වන උපායමාර්ගික ක්‍රියා කාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් (Action Plan) පිළියෙළ කරන්න. (ලකුණු 40)

(iii.) ශ්‍රී ලංකාව තුළ සාර්ථක අන්තර්කරණ අධ්‍යාපනයක් සඳහා ප්‍රතිපත්ති යෝජනාවලියක අඩංගු විය යුතු දැ විභාග කරන්න. (ලකුණු 40)

02. (i.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන් සඳහා පන්තිකාමර ස්ථානගත කිරීමේ විධිවිධාන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

(ii.) ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ට අමතර ඉගැන්වීමේ සහය ලබාදීමේ විධිවිධාන මොනවාදැයි විභාග කරන්න. (ලකුණු 40)

(iii.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සිසුන්ගේ අත්‍යාවශ්‍ය ඉගෙනුම් ප්‍රාප්ති මට්ටම තක්සේරු කිරීම සඳහා තක්සේරුකරණය සඳහා වන සමස්ත පාසල් ප්‍රතිපත්තියක් සංවර්ධනය කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 40)

03. අන්තර්කරණ පන්තිකාමර කළමනාකරණයේදී ගුරුවරුන්ගේ හෝ පරිපාලනයේ ආකල්ප මූලික වේ.

(i.) පාර්ශවකරුවන් තුළ ධනාත්මක ආකල්ප ආරෝපණය කිරීම සඳහා ඉවහල්වන අන්තර්කරණ පන්තිකාමර කළමනාකරණ ක්‍රම හතරක් (04) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 20)

(ii.) පන්තිකාමර කළමනාකරණ ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ඔබ මුහුණ දෙන ගැටලු/ අභියෝග දෙකක් (02) සඳහන් කර එම ගැටලු අභියෝග මග හරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 40)

(iii.) ශ්‍රී ලංකාවේ වර්තමාන විශේෂ අධ්‍යාපන කළමනාකරණ ව්‍යුහය රූප සටහනක් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 40)

04. (i.) විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවකු ඇතුළත් කිරීමේදී අනුගමනය කළයුතු ඇතුළත්කිරීමේ ක්‍රියාපටිපාටියේ පියවර විස්තර කරන්න. (ලකුණු 20)

(ii.) ඔබ සඳහන්කර ඇති පියවර අනුව ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා අධ්‍යාපන දරුවන් ස්ථානගත කිරීම සම්බන්ධයෙන් ඇති හිඩැස් මොනවා දැයි පරීක්ෂා කරන්න. (ලකුණු 40)

(iii.) ඔබ හඳුනාගත් හිඩැස් පිරවීම සඳහා ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 40)

- සියළුම හිමිකම් ඇවිරිණි. -